# 2018 නොවැම්බර් මස මාසික සභා රැස්වීම

## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2018 නොවැම්බර් මස මාසික සභා රැස්වීම 2018.11.08 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබීය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

1. ගරු උප සභාපති - ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එච්.සිරිපාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එල්.ඒ.ගුණතිලක මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.ආර්.රත්නපාල මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

## නිලධාරී සහභාගීත්වය

1. ප්‍රාදේශීය සභාවේ ලේකම් - එස්.රත්නාවතී මැණිකේ මෙනවිය
2. කළමනාකරණ සහකාර - එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත් පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

2018.10.04 වන දින පැවති මාසික සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික වීරසිංහ මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### I. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

- ඩෙන්සිල් කුමාර හොදමුල්ල යන නමින් UD 51 අංක දරණ ජල බිල් පත පීල්ලමාන්නගේ සුමිත් කුමාරසිංහ නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
- අංක NG 517 දරණ ඩී.විමලසේන යන නමින් ඇති ජල බිල් පත එස්.එම්.නලින්ද සම්පත් නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
- අංක LW 18 දරණආර්.එම්.ඒ.රොබට් රණසිංහ යන නමින් ඇති ජල බිල් පත ඩබ්ලිව්.එරන්ද සිසිර කුමාර යන නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
- අංක NG 384 දරණ එස්.බී.එම්.පාලවත්ත යන නමින් ඇති ජල බිල් පත දිලූක බණ්ඩාර මුල්ලෙගම පාලවත්ත යන නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
- අංක AB 33 දරණ කේ.ඕ.පියසේන යන නමින් ඇති ජල බිල් පත කේ.ඕ.සුගන්දි මධුභාෂි යන නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

II. පළාත් සභා,පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ජාතික සන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ ලේකම්ගේ අංක PL/15/11/16(11) හා 2018.09.20 දිනැතිව ඉදිකිරීම් පරිශ්‍ර සඳහා පළාත් පාලන ආයතන මඟින් ලබා දෙනු ලබන බලපත්‍රය සංශෝධනය කිරීමට අදාලව එවන ලද ලිපිය ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි, පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

ලිපි,පෙත්සම් හා පැමිණිලි කිසිවක් ඉදිරිපත් නොවිණි.

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. කල් දී ඇති යෝජනා

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

I. 2019 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපත්ති තීරණය කිරීම හා කෙටුම්පත් අයවැය ලේඛනය සමාලෝචනය කිරීම පිණිස ඉදිරිපත් කිරීම ගරු සභාපතිතුමා විසින් සිදු කරන ලදී.

2019 වර්ෂයට අදාලව මෙම ආයතනයේ කෙටුම්පත් අයවැය ලේඛනය ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව හා පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ මූල්‍ය හා පරිපාලන රීති වලට අනුගත වෙමින් සංශෝධනයන්ට යටත්ව පිළියෙල කර ඇති බවත්,එම කෙටුම්පත් අයවැය ලේඛනය සමාලෝචනය කිරීම පිණිස අවස්ථාව ලබා දෙන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ වන විට සකස්කර ඇති කෙටුම්පත් අයවැය ලේඛනයේ 2019 වර්ෂය සඳහා අපේක්ෂිත මුළු පුනරාවර්තන ආදායම 74,547,557/= වන අතර,මුළු පුනරාවර්ථන වියදම 68,942,361/= ක් ලෙස ගණන් බලා ඇති බවත්,පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 5,605,196/= ක් බව පෙන්වා දුන් ගරු සභාපතිතුමා කාර්යාල ගොඩනැගිල්ල II අධියර සඳහා අනුමත ණය මුදල වෙනුවෙන් වසරක සහන කාලයක් අපේක්ෂිත බැවින් ණය ගැලපුම් සිදු නොකළ බවද පැවසීය.

මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී. සිසිර කුමාර ඉසුරුමුනි මැතිතුමා හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ. ඩබ්ලිව්. කුමාර මැතිතුමා අදහස් ප්‍රකාශ කරමින්, 2019 අයවැය සම්පාදනය කිරීම සැළසුම් සහගතව සිදු කළයුතු අතරම නව ආදායම් ප්‍රභවයන් හඳුනා ගැනීමටත් දැනට තිබෙන ආදායම් උත්පාදන මාර්ග වැඩිදියුණු කිරීමට ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන සලසා ගතයුතු බවත් සඳහන් කළේය.

සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීමට අනුව බල ප්‍රදේශයේ ඇති සියලුම සති පොළවල් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළ ගරු සභාපතිතුමා සතිපොළ සංවර්ධනයට සභා අරමුදල් යෙදවීමට හැකියාවක් නොමැති බැවින්, වෙනත් මූලාශ්‍රයන් යටතේ ප්රතිපාදන සලසා ගැනීමට ක්‍රියා කරන බවද ප්‍රකාශ කළේය. වැලිගෙපොල සතිපොළ අනවසර ඉදිකිරීම් ඉවත්කොට පොළ සංවර්ධනය කිරීමටත්, මාළු ලැල්ල වෙනත් ස්ථානයක ස්ථානගත කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවත්, මෙහිදී සාකච්ඡාවට බඳුන් වූ අතර ආර්ථික වාසි අත්කරගත හැකි දෙල්ගස්හංදිය, ගල්පාය සහ ඕපනායක කඩ කාමර නවීකරණය කිරීම සම්බන්ධයෙන්ද අවධානය යොමු කළයුතු බවට අදහස් පලවිය. තවද ජංගම වෙළඳාම් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමෙන් අවශ්‍යතාවය පිළිබඳව කරුණු සාකච්ඡා වූ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී. සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමාගේ තවදුරටත් අදහස් දැක්වීමට අනුව සභා බල ප්‍රදේශය ඇතුළත තේ දළු ප්‍රවාහන හිමියන්ගෙන් කිසියම් මුදලක් අයකර ගැනීම සුදුසු බවද යොජනා විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා මෙම අවස්ථාවේදී සභාව අමතමින් පුස්තකාල සේවා පුළුල් කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරමින් පොදුවේ ගත්කළ සභා බල ප්‍රදේශයේ ඇති සියලුම පුස්තකාල වල ප්‍රවර්ධනයට අදාලව ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. ඒ සඳහා ජංගම පුස්තකාල සේවාවක් ඇති කිරීමටද යෝජනා විය. සභාව මගින් පාලනය වන වැලිගෙපොල ස්වර්ණ ජයන්ති පුස්තකාලය වෙනත් ස්ථානයක ස්ථානගත කිරීම සම්බන්ධයෙන් සභාවේ අදහස් ප්‍රකාශ වූ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා වැඩසටහන් අංක 4 ජල සේවා ඇස්තමේන්තු මුදල සම්බන්ධයෙන් නැවත සලකා බැලීමක් කරන ලෙස යෝජනා කළේය.

II. 2019 වර්ෂය සඳහා වැලිගෙපොල සතිපොළ සහ රංවල ජනසවි පොළ බදුදීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම පිළිබඳ ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2019 වර්ෂය සඳහා වැලිගෙපොල සතිපොළ බදුදීම පිණිස අවම ලංසුව රු. 13170.00 ක් වන පරිදි ටෙන්ඩර් කැඳවනු ලද බවත් එදින ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එච්.ඒ. පුෂ්පා විජේවර්ධන මහත්මිය පමණක් ටෙන්ඩර් අයදුම්පතක් ඉදිරිපත් කර තිබූ අතර එහි සඳහන් කර තිබූ මුදල රු. 11500.00 ක් වශයෙන් සටහන්ව තිබූ බැවින් එම ටෙන්ඩරය පිරිනැමීම හෝ ප්‍රතික්ෂේප කිරීමට සුදුසු තීරණයක් ගතයුතු බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් වැඩි දුරටත් කරුණු අනාවරණය කළ ගරු සභාපතිතුමා, පසුගිය වසරේද වැලිගෙපොල සතිපොළ කිසිවෙකු විසින් බදු නොගත් බවත් සභාවේ සේවකයෙකු යොදවා බදු මුදල් එකතුකළ අතර බලංගොඩ සහ පල්ලෙබැද්ද නගර වැලිගෙපොලට ආසන්නයේ පිහිටා තිබීම නිසා වැලිගෙපොල නගරය තුල වෙළඳාම දුෂ්කර වී ඇති බවත් සඳහන් කලේය.

රංවල සතිපොළ වෙළඳාම දැන් බහුලව සිදු නොවන අතර වෙළඳුන් විටෙන් විට වෙනස් වන නිසා ලියාපදිංචි කිරීමට ද නොහැකි බවත් අවම ලංසුව වූ රු. 500.00 මුදලටවත් ටෙන්ඩරය ලබා ගැනීමට අයෙකු ඉදිරිපත් නොවූ බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කිරීමෙන් අනතුරුව වැලිගෙපොල සති පොළ සඳහා ඉදිරිපත්ව තිබූ රු 11500.00 ක මුදල අනුව එකී ටෙන්ඩරය ඉහත කී එච්.ඒ. පුෂ්පා විජේවර්ධන මහත්මිය වෙත පිරිනැමීමටත් රංවල සතිපොළ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගන්නා තෙක් සභාවේ සේවකයෙකු යොදවා අයකිරීම් සිදු කිරීමටත් තීරණය විය.

III. 2019 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටුව පිහිටු විම අවශ්‍ය බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2018.10.19 දිනැතිව පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් අංක 2/2018/14 ට අනුව විගණන හා කළමනාකරණ කමිටුවක් සෑම ප්‍රාදේශීය සභාවකම පිහිටුවිය යුතු බව දන්වා ඇති බැවින්, අදාල උපදෙස් පරිදි මෙම සභාවේ විගණන කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් ලෙස,

- ගරු ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා
- ලේකම්
- ගිණුම් විෂය නිලධාරී
- ආදායම් පරීක්ෂක නිලධාරී
- පරිසර විෂය නිලධාරී
- ප්‍රජා සංවර්ධන නිලධාරී
- විමර්ෂණ නිලධාරී

පත්කර ඇති අතර, මෙම විගණන කළමනාකරණ කමිටුව සඳහා ගරු සභාවේ ඒකමතික අනුමැතිය හිමිවිය.

IV. ගල්හිර පල්ලෙවෙල ගෙදර හරහා නවංගොඩ දක්වා දිවෙන මාර්ගය අත්පත් කර ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමටත්,

**V.** 2011 සිට 2017 දක්වා ලේඛන ගතව ඇති රු816,770.06 ක තැම්පත් මුදල් ආදායමට ගැනීමට සභා අනුමැතිය ලබා දෙන ලෙසත් ගරු සභාපතිතුමා විසින් යෝනා කරන ලදී.

ගරු සභාපතිතුමාගේ IV හා V යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

**VI.** මාදොල සිරි මහින්ද පෙර පාසලට වැසිකිළි පද්ධතියක් ඉදි කිරීමේ දැඩි අවශ්‍යතාවක් ඇති බැවින් එය ඉදි කිරීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අවිනි එස්.අබේවික්‍රම මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා

VII. ඩිජිටල් පුස්තකාල පහසුකම් සහිත කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් 7% ක පොළී ප්‍රතිශතය මත රු. 19,920,000.00 ක මුදල අනුමත වී ඇති බවත්,වසරක සහන කාලයෙන් පසුව එම ණය මුදල සහ පොලිය ගෙවීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් කරුණු දැක්වූ ගරු සභාපතිතුමා,වසරක සහන කාලයෙන් පසුව ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා ගත් රු.19,920,000.00 ක මුදල වෙනුවෙන් 7% ක ප්‍රතිශතය මත මාසිකව රු. 231,288.09 ක මුදල වසර 10කින් ගෙවා අවසන් කල යුතු බැවින්, එම මුදල සභා අරමුදලින් දේශීය ණය සංවර්ධන අරමුදල වෙත ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙසත්,එම මුදල නියමිත පරිදි ගෙවීමට සභාව අපොහොසත් වන අවස්ථාවක හිඟ ණය වාරික සහ පොලී මුදල් අය කර ගැනීම සඳහා සභාව වෙත ලැබිය යුතු මුද්දර ගාස්තු,උසාවි දඩ මුදල් ආදියෙන් අයකර ගැනීමට පළාත් පාලන කොමසාරිස් වරයාට (සබරගමුව) බලය පැවරීමට අනුමැතිය ලබා දෙන ලෙසත්, ඉල්ලා සිටින ලදී.

ඒ අනුව ,ඉහත සඳහන් කර ඇති පරිදි ණය වාරික සහ පොළි මුදල් ගෙවීම සහ එසේ වාරික මුදල් නොගෙවන අවස්ථාවක ණය වාරික සහ පොලිය,සභාවට ලැබිය යුතු උසාවි දඩ, මුද්දර ගාස්තු ආදියෙන් අයකර දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත ප්‍රේෂණය කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙත බලය පැවරීම සඳහා වූ යෝජනාවට සභාවේ ඒකමතික අනුමැතිය හිමි විය.

VIII. ඩිජිටල් පුස්තකාලයේ සර්වර් කාමරය (Server Room) වායුසමීකරණය කිරීමට අවශ්‍ය බවත්,

IX. සභාව සතු අබලි තත්වයේ පවතින අංක LF 4847 දරන මහේන්ද්‍රා වර්ගයේ කැබ් රථය හා අංක 52/5637 දරන L200 වර්ගයේ ඩබල් කැබ් රථය වෙන්දේසි කිරීමට අදාල ඉදිරි වැඩකටයුතු සිදු කිරීමටත් සඳහා සභා අනුමැතිය ඉල්ලා සිටින ලදී

ඉහත VIII හා IX යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.රත්නපාල මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

VIII වෙනි යෝජනාව සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා,ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය යටතේ ඕපනායක මහජන පුස්තකාලය ජාලකරණ කටයුතු ඉදිරි සති දෙක ඇතුලත සිදු කිරීමට නියමිත බැවින් ජාලකරණ පද්ධතියේ ස්විචය ඇතුලු සර්වරයේ කල් පැවැත්ම උදෙසා එය ස්ථානගත කිරීමට යෝජනා කරගෙන ඇති සර්වර් කාමරය වායුසමීකරණය කිරීමටත්,CCTV කැමරා පද්ධතියක් සවිකිරීම ඇතුලු ඒ සඳහා වූ සියළු පහසුකම් සළසා දීමටත් අවශ්‍ය බව පෙන්වා දීමෙන් පසු VIII හා IX යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

X. ඩිජිටල් පුස්තකාල පහසුකම් සහිත කාර්යාල ගොඩනැගිල්ලේ II වන අධියර වැඩ කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය බවත්, ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් මඟින් හෝ සීමිත ටෙන්ඩර් කැඳවීමක් මඟින් සිදු කිරීමටත්,

XI. PF 5490 දරන කැබ් රථට අළුත්වැඩියා කිරීමට අවශ්‍ය බවත්,

XII. සභාවේ මාසික සභා රැස්වීම් ආවරණය කිරීම සඳහා පැමිණෙන මාධ්‍යවේදී මහතාට ආරම්භක මහ සභා රැස්වීමේ සිට සහභාගී වූ සෑම රැස්වීම් දිනක් වෙනුවෙන් රු.1000.00ක දීමනාවක් ගෙවීම සුදුසු බවත්, ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

ඉහත X,XI හා XII යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

ගරු මන්ත්‍රිතුමිය විසින් පහත සඳහන් යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. වැලිගෙපොල පොළ භූමියේ ඇති මාළු වෙළඳ සැල වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම සහ පනවා ඇති අවම ටෙන්ඩර් මුදල සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඒ.ඩබ්.සුමනාවතී මැතිතුමිය විසින් පහත සඳහන් යෝජනා සභා ගත කරන ලදී.

I. තැන්නහේන සුසාන භූමියට අයත් භූමිය මැන වෙන්කර ගැනීම අවශ්‍ය බවත්,

II. තැන්නහේන ප්‍රධාන මාර්ගයේ නෙළුම්මන්ඩිය දර්ශන මහතාගේ නිවස දක්වා මීටර් 70 ක කොටස කොන්ක්‍රිට් කිරීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. කරවිලයාය සිට කොහොඹකැටිය දක්වා මාර්ගයට අවශ්‍ය බෝක්කු කඳන් 4 ක් ලබා ගැනීම අවශ්‍ය බවත්,

II. උඩවාඩිය මාර්ගයේ මෛත්‍රීපාල මහතාගේ නිවස අසලට බෝක්කු කඳන් 2ක් ලබා ගැනීම අවශ්‍ය බවත්,

III. ගල්පාය ලයිට් පාරේ සිට කරවිලයාය හරහා හතරමං හන්දිය දක්වා මාර්ගයට බොරළු දැමීම සඳහා JCB යන්ත්‍රය හා ට්‍රැක්ටර් රථය ලබා ගැනීම අවශ්‍ය බවත්,

IV. මඩවලලන්ද පුපුවත්ත මාර්ගය කැපීමට JCB යන්ත්‍රයලබා ගැනීම අවශ්‍ය බවත්,

V. මුත්තෙට්ටුපොල ප්‍රධාන මාර්ගයේ කේ.පී.යසරත්න මහතාගේ නිවසට යන මාර්ගය අසල ළිඳ ලඟට වීථි ලාම්පු සවි කිරීම අවශ්‍ය බවත්,

VI. පුස්සතොට නිල්මිණ ගම මාර්ගයේ යූ.එම්.නිමල් මහතාගේ නිවස අසල කැඩී ඇති බෝක්කුවට බෝක්කු කඳන් ලබා ගැනීම අවශ්‍ය බවත්,

VII. ගොඩකවෙල තැන්න ‘සහිරු’ උදාගම්මානයේ අභ්‍යන්තර මාර්ග සැකසීම සඳහා JCB යන්ත්‍රය ලබා ගැනීම අවශ්‍ය බවත්,

VIII. නිල්මිණි ගම උදාගම්මානයේ අභ්‍යන්තර මාර්ග සැකසීම සඳහා JCB යන්ත්‍රය ලබා ගැනීම අවශ්‍ය බවත්,යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ .රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 5.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ .රෝහණ විජේරත්න මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. මැටිහක්වල කීර්ති මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,ඒ සඳහා රු.215,000.00ක ඇස්තමේන්තුවට සභා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී. තවද,

II. පහළවෙල වෙලේවත්ත මාර්ගය සඳහා හියුම් පයිප්ප ලබා ගැනීම අවශ්‍ය බවත්,

III. මල්මීකන්ද බෝධිය අසල කාණුව සඳහා හියුම් පයිප්ප ලබා ගැනීම අවශ්‍ය බවත්,

IV. හල්ලින්න තැන්න මාර්ගය සඳහා හියුම් පයිප්ප ලබා ගැනීම අවශ්‍ය බවත්,

V. තලගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,

VI. පොල්වත්තහේන හකුරු අරාව මාර්ගය කොන්ක්‍රිට් අවශ්‍ය බවත්,
VII. දාන්දාව පාලම අලුත්වැඩියා කිරීම සුදුසු බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 5.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. කැන්දවින්න මාර්ගයේ මීටර් 100 ක කොටසක් කොන්ක්‍රිට් කිරීමට රු.150,000/= ක මුදලක් වෙන්කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි. සමන්ජීව මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 5.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි. සමන්ජීව මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

I. දඹගහවෙල මාර්ගයේ අම්බැවිල පන්සල අසල කඩාවැටී ඇති බෝක්කුවේ කඩා වැටී ඇති පැති බැම්ම සකස් කිරීම සුදුසු බවත්,
II. බදුල්ලෙගම ගල්කන්ද වත්ත මාර්ගය පස් දමා සකස් කිරීම අවශ්‍ය බවත්,.
III. මැදගංඔය මාර්ගය දෙපස JCB යන්ත්‍රය යොදා එළිකිරීම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

### 5.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

ගරු මන්ත්‍රීතුමා විසින් පහත යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.

I. පනාන පල්ලන්ද සූසාන භූමියට ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සභා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී .ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

### 6.1. 2018.10.04 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

කාරක සභාවේ තීරණ අංක 206-237 දක්වා වූ වියදම් එදින කාරක සභාවට යොමු කරන ලද අතර,එම වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 6.2. 2018.10.10 වන දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව

සභාව සතු දේපල 2019 වර්ෂයට බදු දීම සඳහා ටෙන්ඩර් අයදුම්පත් කැද වූ අතර 2018.10.10 දින ටෙන්ඩර් පත් විවෘත කරන ලද අතර එයට අදාල ටෙන්ඩර් කමිටු වාර්තාව මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

## 7.1. 2018.සැප්තැම්බර් මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 475,037.88 | වැටුප් හා දීමනා | 2,496,892.49 |
| කුලී | 92,199.19 | ගමන් වියදම් | 18,314.00 |
| බලපත්‍ර ගාස්තු | 59,250.00 | සැපයුම් හා උපකරණ | 643,269.00 |
| සේවා සඳහා ගාස්තු | 92,548.00 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියා හා නඩත්තුව | 74,192.07 |
| වරෙන්තු ගාස්තු | 1,510.00 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 395,658.99 |
| වෙනත් ආදායම් | 19,292.64 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 2,182,038.50 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 2,921,876.21 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 16,977.51 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 3,777,767.72 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | 159,463.66 |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 2,921,876.21 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 106,777.78 | සේවක ණය | - |
| තැන්පත් | 124,005.97 | තැන්පත් | 887,384.98 |
| අත්තිකාරම් | 0.00 | ණයහිමි | 412,135.92 |
| ණය ගැති(කර්මාන්ත) | 412,135.92 | අත්තිකාරම් | - |
| වෙනත් ලැබීම් එකතුව | 642,919.67 | ජල ගබඩා | 340,000.00 |
| | | ගබඩා(ඖෂධ) | - |
| | | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | |
| | | වෙනත් ගෙවීම් එකතුව | 1,639,520.90 |

| | | | |
|---|---|---|---|
| මුළු එකතුව | 3,564,795.88 | මුළු ගෙවීම් | 5,417,288.62 |

## 7.2. 2018 සැප්තැම්බර් 30 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.08.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **232324** | **5%** | **632622** | **33%** | **1307378** | 4470957 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8106** | **11%** | **5741** | **27%** | **15159** | 63036 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීම1.43 | | 125000 | | | **123575** | **99%** | **1425** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 255000 | - | | **253800** | **100%** | **1200** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **811500** | **111%** | **(81500)** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **9000** | **30%** | **21000** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **119998** | **26%** | **338002** | |
| 8 | ජල ගාස්තු 4.14 | 1868941 | 6075000 | 1407592 | **75%** | **2965547** | **49%** | **3109453** | 461349 |
| 9 | විකුණුම් | | 497000 | | | **124523** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **242750** | **23%** | **807250** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 250000 | | | **64512** | **26%** | **185488** | |
| 13 | පොදු වෙළඳපල කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුළී 5.23(2) | 178393 | 428000 | 108861 | **61%** | **150500** | **35%** | **277500** | 69532 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **59985** | **55%** | **50015** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 25880 | 254000 | 20880 | 81% | 160680 | 63% | 93320 | 5,000.00 |
| 18 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | 408000 | 102% | (8000) | |
| 19 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | 87300 | 29% | 212700 | |
| 20 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | 0 | 0% | 2,000 | |
| 21 | වෘත්තිය බලපත්‍ර 1.33 | | 100 | | | - | 0% | 100 | |
| 22 | පොලී ආයෝජන 1.61 | | 500 | | | | 0% | 500 | |
| 23 | සේවක ණය පොලී1.64 | | 40000 | | | 32353 | 81% | 7647 | |
| 24 | අයකර ගතහැකි ගාස්තු2.43 | | 25000 | | | 3150 | 13% | 21850 | |
| 25 | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | 1000 | | | 1,500.00 | 150% | (500) | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 27 | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | 500 | | | - | - | 500 | |
| 28 | අය කර ගත හැකි ගාස්තු 4.43 | | 1000000 | | | 671522 | 67% | 328478 | |
| 29 | විශේෂ සැපයුම් සඳහා ගාස්තු4.16 | | 5000 | | | - | - | 5000 | |
| 30 | පොළ භූමිය කුලියට දීම5.25 | | 1000 | | | 300.00 | 0.30 | 700 | |
| 31 | ක්‍රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම6.25 | | 2000 | | | 0 | 0% | 2000 | |
| | වෙනත් ආදායම්* | 15279 | 878140 | 15279 | 100% | 414042 | 47% | 464098 | |
| | මුළු එකතුව | 6837036 | 15179140 | 1793042 | 26% | 7342901 | 48% | 7463762 | 5069874 |

වෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | 8.00 | 5% | 142 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළි කුලියට දීම | | | | | | | | |
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 34,000 | 32% | 73000 | - |
| 7 | සභා භූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 41000 | 21% | 159000 | |
| 10 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 7170 | 48% | 7830 | |
| 11 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 3671 | 18% | 16,329 | |
| 12 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100% | 278893 | 62% | 169497 | - |
| 14 | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | 87600 | | | 49300 | 56% | 38,300.0 | |
| | එකතුව | 15279 | 878140 | 15279 | 100% | 414042 | 47% | 464098 | - |

## 8. පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

පසුගිය සභා රැස්වීමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බවත්, 2018.09.13 දින පැවති මාසික සභා රුස්වීමේ දී අළුදෙනිය මාර්ගයේ කාණු පද්ධතිය ගොඩවීම සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කල අතර ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලද පිළිතුරු ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 9. වෙනත් කරුණු

### 9.2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය

**වැලිගෙපොල රෝහලේ ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සිටියත් පවතින අඩුපාඩු හේතුවෙන් පැමිණෙන රෝගීන් විශාල පිරිසක් බළන්ගොඩ මහ රෝහලට යැවීම සිදුවන බැවින් රෝගීන් දැඩි අපහසුතාවට ලක් වන බවත්,වැලිගෙපොල සංස්කෘතික ගොඩනැගිල්ලේ වැඩ අතර මග නතර කර ඇති බවත්, එම ගොඩනැගිල්ල විවිධ ජාවාරම් කරුවන්ගේ තිප්පලක් බවට පත් වී ඇති බැවින් එම ගොඩනැගිල්ලේ වැඩ නැවත ආරම්භ කරන ලෙස සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට දන්වන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලි සිටින ලදී.**

### 9.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

පනාන මාර්ගයේ වසර තුනක පමණ කාලයක පටන් බස් රථ ධාවනය නැවතී ඇති අතර,එහි ඇති පාලමද පුපුරා ඇතිබවට කරුණු දැක්වූ ගරු මන්ත්‍රීතුමා,කැළැවැදී ඇති කපුගල රෝහල් ගොඩනැගිල්ල ආයුර්වේද බෙහෙත් ශාලාවක් ස්ථාපිත කිරීමට සුදුසු බැවින් ඒ සම්බන්ධවද කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

### 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා

**මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වතු කම්කරුවන් විශාල පිරිසක් සිටින බැවින් ඔවුන්ගේ වැටුප් වැඩි කිරීම පිළිබඳ රජයට මැදිහත් වන ලෙස කම්කරු අමාත්‍යාංශයට ඉල්ලීමක් කරන ලෙස දන්වා සිටින ලදී.**

### 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය විසින් ඕපනායක නගරයේ උදැසන පවතින දැඩි මාර්ග තදබදයට පිළියමක් ලෙස පාසල් වාහන නැවැත්වීමට වසා දමා ඇති ආහාර ගබඩාවේ මිදුල යොදා ගැනීමට වැඩපිළිවෙලක් යොදන ලෙස ඉල්ලා සිටින ලදී.

### 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා

**ගරු මන්ත්‍රීතුමා විසින් විදුලිය විසංධි කිරීම් සිදුකරන විට ඒ සම්බන්ධව මහජනතාව නිසි ලෙස දැනුවත් කර ජනතාව අපහසුතාවට ලක් නොවන අයුරින් එම කටයුතු සිදු කරන ලෙස ඇඹිලිපිටිය විදුලි ඉංජිනේරු දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.**

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

බලන්ගොඩ ඩිපෝ අධිකාරියෙන් හත්තැලිහෙල දක්වා ධානය වන බස් රථය පාඩු ලබන බැවින් ධාවනය නතර වී ඇති බැවින් ඒ සම්බන්ධව ඩිපෝ අධිකාරී දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ලදී.

## 9.8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

**ගරු මන්ත්‍රීතුමා විසින් ගල්හිර හන්දියේ ප්‍රධාන මාර්ගය දෙපස කාණු පද්ධතිය ගොඩවී ඇති බව මාර්ග සංවර්ධන අධිකාරියට දන්වා යවන ලෙස ඉල්ලීමක් කල අතර,සිසු සැරිය බස් රථ වලට බාහිර මගීන් ඇතුළුකර නොගැනීමට සුදුසු පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.**

## 9.9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

**වැලිගෙපොල හා ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා රජයෙන් විශාල මුදලක් වෙන් වී ඇති බැවින් රටේ පවතින දේශපාලන තත්වය හමුවේ එම මුදල් අපතේ යාමට ඉඩ නොදී බල ප්‍රදේශයේ වැඩ සඳහා යොදා ගැනීමට සියළු දෙනා එක්ව කටයුතු කල යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.**

### සභා රැස්වීමේ නිමාව

ප්‍රාදේශීය සභාව මඟින් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් යම් සේවාවක් ඉටු කිරීමට සියළුදෙනා සහයෝගයෙන් එක්ව කටයුතු කලයුතු බව පැවසූ ගරු සභාපතිතුමා අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තුතිය පලකල ගරු සභාපතිතුමා සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කරමින් සභාවේ කටයුතු පස්වරු 12.00ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,
සභාපති,
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව